# නවක ඉංග්‍රීසි භාෂා ගුරුවරුන් 3000ක් පුහුණු කිරීම

# ත්‍රෛභාෂා පුරවැසියා ව්‍යාපෘතිය
# (Trilingual Citizen)

ත්‍රෛභාෂා පුරවැසියා ව්‍යාපෘතිය, ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය - National Institute of Language Education & Training - NILET, නිල භාෂා හා වෘත්තීය අධ්‍යයන ආයතනය Institute of Official Languages and Professional Studies - IOLPS ඒකාබද්ධව සිදු කරන ව්‍යාපෘතියකි. NILET ආයතනය රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය යටතේ පවතින ආයතනයකි. මෙම ව්‍යාපෘතිය ත්‍රෛභාෂා හැසිරවීමේ හැකියාව ශ්‍රී ලාංකික ජනතාව අතර ප්‍රවර්ධනය කිරීම හා ජාතික සුසංයෝගය ඇති කිරීම අරමුණු කරගත් ව්‍යාපෘතියක් වන අතර මෙමගින් පුහුණු කරන ගුරුවරුන් මගින් දීපව්‍යාප්තව පොදු ප්‍රමිතියක් යටතේ ක්‍රමවත් ඉංග්‍රිසි අධ්‍යාපනයක් ශ්‍රී ලාංකිය දරු පරපුරට හා තාරුණ්‍යයට ලබා දීමට අපේක්ෂිතය.

## I තෝරා ගන්නා ආකාරය

සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක්ම ආවරණය වන පරිදි ආධුනික ඉංග්‍රීසි භාෂා ගුරුවරුන් ලෙස පුහුණුවට අයදුම්පත් කැඳවීමක් සිදුකරන අතර සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීමෙන් පසු අවසාන තෝරා ගැනීම සිදු කෙරේ.

## II අවශ්‍ය අවම සුදුසුකම්

- වයස අවුරුදු 20ත් 40ත් අතර වීම.
- අ.පො.ස සාමාන්‍ය පෙළ ඉංග්‍රීසි විෂය සඳහා අවම වශයෙන් සම්මාන සාමාර්ථ්‍යක් ලබා තිබීම.
- අ.පො.ස. උසස් පෙළ ප්‍රධාන විෂයන් තුනක් එකවර සමත්ව තිබීම.
- අදාළ ක්ෂේත්‍රයේ NVQ Level -4 මට්ටමේ සුදුසුකමක් හෝ
- ත්‍රෛභාෂා පුරවැසියා ව්‍යාපෘති මණ්ඩලය පිළිගන්නා වෙනත් සුදුසුකම්.

## III ඉංග්‍රීසි ගුරුවරුන් ලෙස ලබා දෙන පුහුණුව ක්‍රියාත්මක වන ආකාරය

ත්‍රෛභාෂා පුරවැසියා ව්‍යාපෘතියේ ඉංග්‍රීසි භාෂා ගුරුවරුන් ලෙස පුහුණුවට බඳවාගන්නා ගුරු පුහුණුලාභීන් සඳහා වසර 02ක ඉංග්‍රීසි භාෂා ගුරු පුහුණුවක් ලබාදේ. මෙම පුහුණුව ◆ නේවාසික ◆ අනේවාසික ◆ මාර්ගගත සහ පාසල් තුළ ප්‍රයෝගික පුහුණු කාලයක් සහිත ලෙස සකසා ඇත. ඒ අනුව පළමු වසර තුළ National Diploma in Teaching English as a Second Language NVQ Level – 05 හා දෙවන වසර තුළ Higher Diploma in Teaching English as a Second Language පාඨමාලා වශයෙන් ක්‍රියාත්මක කෙරේ.

## IV පුහුණුලාභීන් ත්‍රෛභාෂා ව්‍යාපෘතිය සමඟ ඉංග්‍රීසි භාෂා ගුරුවරයෙකු වීම, භාෂා මධ්‍යස්ථාන ක්‍රියාත්මක වීම හා භාෂා මධ්‍යස්ථානයක හිමිකරුවකු වන ආකාරය.

(අ) ත්‍රෛභාෂා පුරවැසියා ව්‍යාපෘතිය යටතේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක්ම ආවරණය වන පරිදි එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ ත්‍රෛභාෂා මධ්‍යස්ථාන Trilingual Learning Centers - TLC තුන බැගින් (03) ආරම්භ කිරීමට යෝජිතව ඇත.

(ආ) ව්‍යාපෘතියට ඇතුළුවන ගුරු පුහුණුලාභීන් ඔවුන්ගේ පළමු වසර සම්පූර්ණ කිරීමත් සමඟ (NVQ 05) ත්‍රෛභාෂා පුහුණු මධ්‍යස්ථානයක (TLC) ගුරුවරයෙකු හෝ හිමිකරුවකු වීමට සුදුසුකම් ලබයි.

(ඇ) ආරම්භ කිරීමට යෝජිත TLC තුළ පියවර 8ක් යටතේ වයස අවුරුදු 05 සිට 13 දක්වා වයස් මට්ටම්හි දරුවන්ට ගැළපෙන ලෙස නව ක්‍රමවේදයක් ඔස්සේ ඉංග්‍රීසි භාෂා පාඨමාලා ආරම්භ කරනු ඇත. ව්‍යාපෘතියේ දෙවන වසර සිට වයස අවුරුදු 14 සිට ඉහළ වයස් කණ්ඩායම් සඳහා ඉංග්‍රීසි භාෂා පාඨමාලා ආරම්භ කෙරේ.

(ඈ) TLC මධ්‍යස්ථානයන්හී උගන්වනු ලබන සියලුම පාඨමාලා සඳහා අවශ්‍ය පොත් පත්, විෂය නිර්දේශ විභාග පැවැත්වීම සහ සහතිකපත් නිකුත් කිරීම රජයේ පිළිගැනිම සහ අධීක්ෂණය සහිතව පොදු ප්‍රමිතියක් යටතේ සිදුකෙරේ.

(ඉ ) TLC මධ්‍යස්ථානවල ක්‍රියාත්මක පාඨමාලාවන් සඳහා අයකළ හැකිවන්නේ ව්‍යාපෘතිය මගින් අනුමත ගාස්තුව පමණි. මේ මගින් සහනදායි ක්‍රමවේදයක් ඔස්සේ රටේ දරුවන්ට ඉගෙන ගැනීමට අවස්ථාව උදාකරදීමට සැලසුම් කර ඇත.

(ඊ) TLC මධ්‍යස්ථාන ආදායමෙන් 70%ක් භාෂා මධ්‍යස්ථාන භාරකරුවන්ට හිමිවේ. ඉතිරි 30%ක කොටස ත්‍රෛභාෂා ව්‍යාපෘතිය වෙත ගෙවිය යුතුවේ.

(උ) TLC මධ්‍යස්ථාන සඳහා ළමුන් බඳවා ගැනීමට අදාල ප්‍රචාරක කටයුතු ත්‍රෛභාෂා ව්‍යාපෘතිය මගින් සිදුකරන අතර භාෂා මධ්‍යස්ථානයට සම්බන්ධ අදාල ගුරුවරයාගේ ආකල්ප, කුසලතාව, හැකියාව සහ කැපකිරීම මත අදායම උපරිම තත්වයකට වැඩිකරගත හැකිවේ.

(එ ) කඩිනමින් TLC මධ්‍යස්ථානයක් ආරම්භ කර පවත්වාගෙන යාමට හැකියාව ඇති නව ව්‍යවසායකත්වයට නැඹුරු ශ්‍රී ලාංකිකයන්ට ඒ සඳහා නව අධ්‍යාපන ව්‍යවසායකයින් 350ක් බලගැන්වීම යටතේ අවස්ථාව සලසා දිය හැකිවේ. ඒ සඳහා ලිඛිතව ඉල්ලීමක් කල යුතුයි.

## V පාඨමාලා කාලය :

සම්පූර්ණ පාඨමාලා කාලය වසර 02 කි. (අධ්‍යයන වාර 04 කි)

## VI පාඨමාලා ගාස්තුව :

• ලියාපදිංචි ගාස්තුව රු. 30,000 කි. •• දේශන,විභාග හා අනෙකුත් ගාස්තු රු. 395,000 කි.
(නේවාසික පුහුණු කාල සීමාව තුළ ආහාර සහ නවාතැන් පහසුකම් නොමිලේ ලබාදේ)

## VII ගාස්තු ගෙවන ආකාරය :

1. ලියාපදිංචි ගාස්තුව - පාඨමාලාවට අයදුම්පත් යොමු කර සම්මුඛ පරීක්ෂණයට කැඳවීමෙන් අනතුරුව ව්‍යාපෘතියට තෝරා ගන්නේ නම් ඒ බව දැනුම් දීමෙන් අනතුරුව ගෙවිය යුතුයි.
2. දේශන, විභාග හා අනෙකුත් ගාස්තු - මෙය පහත සඳහන් ක්‍රමවේදයන්ගෙන් ගෙවීම සිදුකළ හැකිවේ.

### A. එකවර ගෙවීම මගින්,

දේශන හා අනෙකුත් ගාස්තු එකවර ගෙවීමේදී 10% ක වට්ටමක් හිමි වේ.
(අවශ්‍ය අය සඳහා බැංකු ණය පහසුකම් සලසා දිය හැක.)

### B. අධ්‍යයන වාර වශයෙන් ගෙවීම මගින්,

1. පළමු අධ්‍යයන වාරය - රු. 98,750/=
2. දෙවන අධ්‍යයන වාරය - රු. 98,750/=
3. තෙවන අධ්‍යයන වාරය - රු. 98,750/=
4. සිව්වන අධ්‍යයන වාරය - රු. 98,750/=

# ව්‍යාපෘතියේ අරමුණු

**නවක ඉංග්‍රීසි භාෂා ගුරුවරුන් 3 000ක් (තුන් දහසක්) පුහුණු කිරීම.**

**නව අධ්‍යාපන ව්‍යවසායකයින් 350ක් බලගැන්වීම**

## ත්‍රෛභාෂා පුරවැසියා ව්‍යාපෘතියට සම්බන්ධවීමේ වැදගත්කම.

01. පළමු අධ්‍යයන වර්ෂය එනම් NVQ 05 මට්ටම සම්පූර්ණ කළ පසු රජයේ වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයට අයදුම් කළ හැකිවීම සහ ත්‍රෛභාෂා පුරවැසියා ව්‍යාපෘතියේ ඉංග්‍රීසි භෂා ගුරුවරයෙකු වීම මගින් ඉහළ ආදායම් ලබන අයෙකු බවට පත්වීම.

02. දෙවන අධ්‍යයන වර්ෂය එනම් Higher Diploma in Teaching English as a Second Language සම්පූර්ණ කළ පසු මාස 12ක කාලයක් තුළ අධ්‍යාපනවේදී ( Bachelor of Education -B.Ed ) ඉංග්‍රීසි උපාධිය සම්පූර්ණකර රජයේ ඉංග්‍රීසි ගුරුවරයෙකු ලෙස අයදුම් කිරීමට සුදුසුකම් ලැබීම.

03. උසස් අධ්‍යාපන වරම් සඳහා පිළිගත් සුදුසුකමක් වීම.

## අයදුම් කරන ආකාරය :

a. www.iolps.lk වෙබ් අඩවිය වෙත ගොස් අයදුම්පත බාගත කර ගැනීම හෝ 072 8110110 දුරකතන අංකයට Wha tsApp පණිවුඩයක් යොමුකර නිල අයදුම්පත ගෙන්වා ගැනීම.

b. ඕනෑම මහජන බැංකු ශාඛාවකින් අංක 208100160035161 දරණ "නිල භාෂා හා වෘත්තිය අධ්‍යයන ආයතනය" නමින් ඇති ගිණුමට අයදුම්පත් ගාස්තුව ලෙස රු. 1000/= ක මුදලක් තැන්පත් කළ යුතුය. මුදල් තැන්පත් කිරීමේ දී තැන්පත්කරුගේ නම, ලිපිනය, දුරකථන අංකය හා ජා.හැ. අංකය, බැංකු තැන්පතු පත්‍රිකාවේ පිරවිය යුතුය. තැන්පතු පත්‍රිකාවේ ඇති "හේතුව" යන ස්ථානයේ "ත්‍රෛභාෂා පුරවැසියා" යනුවෙන් සටහන් කළ යුතුය.

c. සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍රය, මුදල් ගෙවන ලද රිසිට්පත සහ තම නම හා ලිපිනය නිවැරදිව ලියන ලද රු. 110/= ක මුද්දර අලවන ලද 4' 9" දිග ලියුම් කවරයක් සමග ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට යොමු කරන්න.

ලිපිනය : නිල භාෂා හා වෘත්තීය අධ්‍යයන ආයතනය
"ත්‍රෛභාෂා පුරවැසියා"
ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය,
අංක 321/1, හයිලෙවල් පාර, මාකුඹුර, පන්නිපිටිය.

**අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය 2024 අගෝස්තු 31.**
**අයදුම්පත් ලැබෙන පිළිවෙළ අනුව කඩිනමින් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ.**

Institute of Official Languages and Professional Studies
"Trilingual Citizen"
No. 275, Kaduwela Road,
Battaramulla.

---

Institute of Official Languages and Professional Studies
"Trilingual Citizen"
National Institute of Language Education and Training
No. 321/1, Hight Lvel Road,
Makumbura, Pannipitiya.

011 2 77 77 57
071 2 77 77 57
www.iolps.lk



## විනෝද් කුමාර් මුණසිංහ මහතා

## ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ සභාපතිතුමාගේ පණිවුඩය

මෙරට රාජ්‍ය භාෂාවන සිංහල හා දෙමළ භාෂා පුහුණුව සම්බන්ධයෙන් ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය ජාතික කර්තව්‍යයක් ඉටුකරනු ලබන අතර ඊට සමගාමීව ඉංග්‍රීසි භාෂා අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම හා ජනගත කිරීම කාලීන අවශ්‍යතාවයක්ව පවතී. එම ජාතික කර්තව්‍ය සඳහා මෙම ආයතනය නිල භාෂා හා වෘත්තීය අධ්‍යයන ආයතනය සමග එක්ව දියත් කරනු ලබන "ත්‍රෛභාෂික පුරවැසියා" ව්‍යාපෘතිය ග්‍රාමීය මට්ටමෙන් ඉංග්‍රීසි භාෂාව ප්‍රවර්ධනය කිරීමේ වැඩපිළිවෙළක් ලෙස හඳුන්වාදීමට ලැබීම අප ලද භාග්‍යයකි.

මෙරට ජනතාව ත්‍රෛභාෂික දැනුමින් සන්නද්ධ කිරීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ද සංකල්පයකි. ඒ අනුව ආයතන සහ ඒවායෙහි ධාරිතාව සංවර්ධනය කිරීම උදෙසා පෞද්ගලික ආයතන හා අත්වැල් බැඳ ගනිමින් ආරම්භ කරනු ලබන සංවර්ධන කාර්යයක් ලෙසද මෙම ව්‍යාපෘතිය වැදගත් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අග්‍රාමාත්‍ය රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමාගේ නායකත්වයෙන් නවෝත්පාදන ප්‍රවේශයක් ලෙස ක්‍රියාත්මක කෙරෙන මෙම ව්‍යාපෘතියෙන් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට ඉදිරි දැක්මක් ඇති තරුණ ව්‍යවසායකයකු ලෙස මෙම ව්‍යාපෘතිය හා එකතු වන ලෙස මා ඔබට ආරාධනය කරමි.



## ෂමින්ද මහලේකම් මහතා

## ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ අධ්‍යක්ෂ ජෙනරාල්තුමාගේ පණිවුඩය

ශ්‍රී ලාංකික ප්‍රජාවගේ ත්‍රෛභාෂා හැකියා වැඩි දියුණු කිරීම සම්බන්ධ ජාතික ආයතනයක් වශයෙන් ක්‍රියාත්මක වන ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය මෙම වර්ෂයේදී ඉංග්‍රීසි ඇතුළු විදේශ භාෂා පුහුණුව සම්බන්ධ කාලීන වැඩසටහන් ජනගත කිරීමේ ප්‍රයත්නයක නිරත වී සිටියි.

එවන් පසුබිමක ඉහත කාර්යභාරය ජනතාවට සමීප කිරීමේ අරමුණින් අප ආයතනය සහ නිල භාෂා හා අධ්‍යයන ආයතනය එක්ව දීපව්‍යාප්තව ලාංකේය පුරවැසියා ඉංග්‍රීසි භාෂා දැනුමෙන් සවිබල ගැන්වීම සඳහා "ත්‍රෛභාෂා පුරවැසියා" ව්‍යාපෘතිය ආරම්භ කිරීමට හැකිවීම පිළිබඳ ආයතනයේ වත්මන් අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් සතුටට පත්වෙමි.

එසේම, මෙම ව්‍යාපෘතිය මගින් නව ව්‍යවසායකයින් බිහිවීම හා රැකියා අවස්ථා නිර්මාණය වීමද සිදුවන බැවින්, ලාංකේය ප්‍රජාව ඉංග්‍රීසි භාෂා දැනුමෙන් පොහොසත් කිරීමට මෙන්ම මෙරට ආර්ථික සංවර්ධනයටද ශක්තියක් වන 'ත්‍රෛභාෂා පුරවැසියා' ව්‍යාපෘතිය සමඟ එකතු වන මෙන් ඔබ සියලු දෙනාට ගෞරවයෙන් ඇරයුම් කරමි.



## චූලන් කුමාර රත්නායක මහතා

# නිල භාෂා හා වෘත්තීය අධ්‍යයන ආයතනයේ සභාපතිතුමාගේ පණිවුඩය

රටක් දියුණු කිරීමටනම් ප්‍රධාන අංශ  තුනක සංවර්ධනය ඉතාමත් වැදගත් දෙයකි. එනම් , අධ්‍යාපන අංශය (EDUCATION) ආර්ථික අංශය (ECONOMIC ) හා පරිසරයයි. (ENVIRNMENT). පරිසරය ගැන කතා කිරීමේදී පුද්ගල මානසික පරිසරය සංවර්ධනයට ද ප්‍රමුඛතාවක් දියයුතුව ඇත.එසේම, ශ්‍රී ලාංකීය දරුපරපුරේ සහ වැඩිහිටියන්ගේ ආකල්ප  සංවර්ධනය (ATTITUDE) ද ඉතාමත් අත්‍යවශ්‍ය දෙයකි.

ඕනෑම දෙයක් කළ හැකි, කිසිදෙයක් නිකන් ලැබෙන තෙක් බලා නොසිටි ජාතියක් වන ශ්‍රී ලාංකීය ජාතියේ එම සැඟ වුන ශක්තීන් අවදි කර එම ශක්තිය නැවත ශ්‍රී ලංකාව  ගොඩනැගීම සඳහා යොදාගැනීමට හැකි ඉදිරිගාමී තරුණ පරපුරක පිබිදීම පෙර කවර දිනකටත් වඩා  අද වන විට අපට අවශ්‍යව ඇත. ඒ සඳහා නායකත්වය දීමට කටයුතු කිරීම වගකීමක් ඇති සියලුම ශ්‍රී ලාංකිකයන්ගේ යුතුකමයි. රජය,සිවිල් සමාජය,රාජ්‍ය  සහ පුද්ගලික  අංශයේ ව්‍යාපාර සහ සාමාන්‍ය පුරවැසියන් ඇතුළු සැමට පොදු සහ පුද්ගලික වගකීමක් ඇත. එනම්, රටෙන් තමන්ට ලැබෙන දෙය නොව තමන්ගෙන් රටට ලබාදෙන දෙය සම්බන්දව යි. රටේ සියලුම පුරවැසියන් ව්‍යවසායකත්ව මානසිකත්වයකට නැඹුරු කරවීම  මගින් රට ගොඩ නංවාලීමට කටයුතු කිරීම ඉතාමත් වැදගත් වේ. අපගේ මෙම ව්‍යාපෘතිය තුලින් අධ්‍යාපන ව්‍යවසායකයින් බිහිකිරීමටත්, ඔහුන් හරහා අධ්‍යාපනය සංවර්ධනය තුලින් ගොඩනැගෙන ආර්ථිකයක් බිහිකිරීමට නිල භාෂා හා වෘත්තිය අධ්‍යායන ආයතනය  ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය සමඟ රාජ්‍ය හා පුද්ගලික අංශ ඒකාබද්ධ ව්‍යාපෘතියක්  ලෙස මෙම වැඩ සටහන ක්‍රියාත්මක කිරීමට හැකිවීම පිළිබඳව අතිශයින් සතුටුවෙමි.

## Application Form to Enroll in English Teacher Training Program Under the Trilingual Citizen Project

## ත්‍රෛභාෂා පුරවැසියා ව්‍යාපෘතිය යටතේ ඉංග්‍රීසි භාෂා ගුරු පුහුණුවට ඇතුලත් වීම සඳහා අයදුම් පත්‍රය

1. Full Name
   සම්පූර්ණ නම

2. Name with Initials
   මුලකුරු සමඟ නම

3. Address
   ලිපිනය

4. Contact No
   දුරකථන අංකය

   Whatsapp No
   වට්ස්ඇප් අංකය

5. Divisional Secretariat
   ප්‍රා. ලේකම් කොට්ඨාසය

   District
   දිස්ත්‍රික්කය

6. Province
   පළාත

   G.S. Area
   ග්‍රාමසේවා වසම

7. Personal Information
   පෞද්ගලික තොරතුරු

   Date of Birth
   උපන් දිනය

   Age
   වයස

   Gender
   ලිංග භේදය

   Civil Status
   විවාහක/අවිවාහක බව

   Mother/ Father/Guardian's Name
   මව / පියා / භාරකරුගේ නම

   Contact No
   දුරකථන අංකය

8. Educational Qualifications

අධ්‍යාපන සුදුසුකම්

| O/L Year | | Index No | |
|---|---|---|---|

| Subjects | Grade |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

| A/L Year | | Index No | |
|---|---|---|---|

| Subjects | Grade |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

Other Qualifications

වෙනත් සුදුසුකම්

| |
|---|
| |
| |
| |
| |
| |
| |
| |
| |

- ඔබ පදිංචි ස්ථානයේ සිට ලඟම ඇති නගරයට ආසන්න වශයෙන් ඇති දුර ප්‍රමාණය

| | | | | |
|---|---|---|---|---|
| | | | K | M |

- ඔබ පදිංචි ස්ථානයට ආසන්නතම නගරයේ ඇති පාසල් ප්‍රමාණය

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | | |

- ඔබ මෙම ව්‍යාපෘතිය යටතේ භාෂා මධ්‍යස්ථානයක් (TLC) පවත්වාගෙන යෑමට අදහස් කරන නගරයේ නම

| | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | |

- එම නගරය අයත් වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

| | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | |

ඔබ මෙම ව්‍යාපෘතිය යටතේ ඉංග්‍රීසි භාෂා ගුරුවරයෙකු වීමට අදහස් කරන හේතුව කෙටියෙන් පැහැදිලි කරන්න.

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි ප්‍රකාශ කරමි.

නම : ......................................................................

දිනය : ......................................................................

අත්සන : ......................................................................

මව / පියා / භාරකරුගේ ප්‍රකාශය

ත්‍රෛභාෂා පුරවැසියා ව්‍යාපෘතිය යටතේ ඉංග්‍රීසි භාෂා ගුරුවරයෙකු ලෙස පුහුණුවට අයදුම්කරන ...................................................................... (නම) යන අය මාගේ (දුව/පුතා)................................... වන අතර ඔහු / ඇය මෙම වැඩසටහනට සම්බන්ධ කර ගන්නා ලෙස කාරුණිකව ඉල්ලා සිටින අතර වැඩසටහන සාර්ථකව ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය සියලුම සහයෝගය ලබාදෙන බවට මෙයින් සහතික කොට ප්‍රකාශ කර සිටිමි.

නම : ......................................................................

අයදුම්කරුට ඇති නෑදෑකම : ................................................

දිනය : ......................................................................